දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2014 අප්‍රේල්
First Examination in Arts (External) - April 2014

දේවිප්‍ර 1.2 - ක්‍රි.ව. 1832 සිට ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හා දේශපාලනය
PS 1.2 – Government and Politics of Sri Lanka Since 1832

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

(01) 1832 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ වල ආර්ථික, දේශපාලන සහ සමාජීය බලපෑම විචාරාත්මකව සාකච්ඡා කරන්න.

(02) "ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය ස්වාධීනතා ව්‍යාපාරයකට වඩා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අරමුණු කරගත් ව්‍යාපාරයක් විය." විමසන්න.

(03) ශ්‍රී ලංකාවේ දේශපාලන වර්ධනය කෙරෙහි 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණවල දායකත්වය පිළිබඳ ඇගයීමක් කරන්න.

(04) "1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකාවට ප්‍රදානය කළේ පූර්ණ වගකීම් සහිත ආණ්ඩු ක්‍රමයක් නොව ඩොමීනියන් තත්ත්වයේ ආණ්ඩු ක්‍රමයකි" විභාග කරන්න.

(05) 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව හඳුන්වාදීමට පසුව ඉදිරිපත් කළ තර්ක මොනවා ද?

(06) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් නවාංගයන් මොනවා ද? ඒවා කොතරම් දුරට සාර්ථක වී ද?

(07) ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාදාමය තුළ වාමාංශික ව්‍යාපාරයේ කාර්යභාරය තක්සේරු කරන්න.

(08) "බහු පක්ෂ ක්‍රමයක සිට ද්වි සහාග ක්‍රමයක් කරා ගිය ගමනක්" 1948 සිට 2014 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ක්‍රියාකාරිත්වය ආශ්‍රිතව මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(09) 2005 - 2014 කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියෙහි ගමන් මඟ පිළිබඳව විමසීමක් කරන්න.

(10) පහත සඳහන් කරුණු <u>දෙකක් (02)</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.

1. ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ ජනතාවගේ දේශපාලන ඉල්ලීම්
2. 2014 දකුණු සහ බස්නාහිර පළාත් සභා මැතිවරණය
3. ශ්‍රී ලංකාවේ මානව අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තරයේ මැදිහත්වීම
4. ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාදාමය තුළ ආගමික සංවිධාන වල ක්‍රියාකාරිත්වය

********************************************